චක්‍රලේඛ අංක:- 11/2005

මගේ අංකය:- බප/සසේකො/ලේ/තීර්
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක: 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2005.08.04

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා
සමුපකාර සමිති, දිස්ත්‍රික් බැංකු සංගම් හා
සමුපකාර ණය දෙන සමිතිවල
සභාපතිවරුන් වෙත.

මහත්මයාණනි,

**මූලික විමර්ශණයකින් තොරව විනය ක්‍රියා මාර්ග ගත හැකි අවස්ථා.**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් නිකුත්කර ඇති 01/97 හා 1997.03.12 දිනැති චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ. මින් මතුවට පහත සඳහන් උපදෙස් අනුගමනය කලයුතු බව බස්නාහිර පළාත් සමුපකාර කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙනු ලැබේ.

02. බස්නාහිර පළාතේ බලාත්මක වී ඇති 1108/16 හා 1999.12.01 දින රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය බලාත්මක වූ දින සිට පහත සඳහන් නියමය බලපැවැත්වේ.

ප්‍රඥප්තියේ 46 (1) වගන්තිය යටතේ කෙරෙන විභාගයකින් 47 (1) වගන්තිය යටතේ කෙරෙන පොත් පත් පරීක්ෂණයකින් ද, හා 47 (2) යටතේ කෙරෙන විමර්ෂනයකින් සමුපකාර සමිතියක යම් සේවකයෙකු හෝ නිලධාරියෙකු වරදක් කර ඇති බව අනාවරණය වී ඇත්නම් ඒ මතම විනය බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයට එම සේවකයාට හෝ නිලධාරියාට එරෙහිව මූලික විමර්ශණයකින් තොරව විනය කටයුතු කිරීම නීත්‍යානුකූල බව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ ඇත.

03. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබ ආයතනයේ සියළුදෙනා වෙතට දැනගැනීමට සලස්වන ලෙස ද දැනුම් දෙමි.

කේ.කේ.සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව.

පිටපත්:-
1. ප්‍රධාන ලේකම් (බ.ප.) දැ.ගැ.පි.
2. පෞද්ගලික ලේකම්, පළාත් මාර්ග, සමුපකාර ගරු. අමාත්‍ය (බ.ප.)
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
4. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
6. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් වරුන්
7. සියළුම වෘත්තීය සමිති.